Prepared by- P.E.M.R.R.R.ඒකනායක

කලාප අධ්‍යාපන කාර්යාලය ඇඹිලිපිටිය

## නාට්‍යයෝපකරණ

## වේදිකා පසුතල නිර්මාණය

ආහාර්ය අභිනයට අයත් අනුශාංගික අංග යටතේ එන රංගභූමි අලංකරණය හෙවත් වේදිකා පසුතල නිර්මාණ මගින් වේදිකා නාට්‍යයේ ගලායාමට මනා සහයක් ලබාදෙයි. නාට්‍ය පිටපතක සඳහන් වන ස්ථානයක්,දෙයක් වේදිකාව තුල ප්‍රේක්ෂකයාට ගෝචර වන අයුරින් ප්‍රතිනිර්මාණය කිරීම මෙමඟින් සිදු කරයි.

මේස,පුටු, ගස්,දොර,ජනේල,පර්වත,පඩිපෙළ,නිවාස,මාලිගා,වාහන,මුහුදුවෙරළ වැනි දෑ පසුතල වලට උදාහරණ කිහිපයකි.

වේදිකා පසුතල බහුලව යොදා ගනු ලබන්නේ ස්වභාවික නාට්‍ය ( ලෝක ධර්මී නාට්‍ය ) වල වන අතර නාට්‍ය ධර්මී නාට්‍ය වල වේදිකා පසුතල යොදා ගැනීම ඉතා අවම මට්ටමක පවතී



### වේදිකා පසු තල නිර්මාණ කරණයේදී සැලකිලිමත් විය යුතු කරුණු

- නාට්‍ය ශෛලිය හඳුනා ගැනීම
- නාට්‍ය තේමාව හා නාට්‍යට උචිත වීම
- කතා වස්තුවට අයත් දේශය/යුගය/සමාජ ආර්ථික දේශපාලන පසුබිම
- නාට්‍ය නිෂ්පාදක වරයාගේ මතය
- නිෂ්පාදන පිරිවැය
- නළු නිලියන්ගේ රංග කාර්යට භාධාවක් නොවීම
- රංග වස්ත්‍රාභරණ හා රංගාලෝකය සමග මනා සුසංයෝගය
- පහසුවෙන් වෙනස් කල හැකි සහ ප්‍රවාහනය කල හැකි වීම
- වේදිකාව (රංගශාලා )පිළිබඳ අවබෝධය ( ශ්‍රී ලංකාව වැනි රටවල ප්‍රදේශයෙන් ප්‍රදේශයට රංග ශාලාවල ඇති වේදිකා වෙනස්වීම )

පසුතල නිර්මාණ සඳහා භාවිත කල හැකි අමුද්‍රව්‍ය

- සැහැල්ලු ලෑලි ( අඹ,ලුනුමිදෙල්ල,ඇල්බීසියා )
- වැනිස්ට්‍රා බෝඩ්
- ගෝනි
- සිමෙන්ති කොල
- ඇලුමිනියම් තහඩු
- පී.වී.සී.බට වර්ග ,ප්ලාස්ටික් හෝ යකඩ බැරල්
- ආදේශක ලෙස භාවිතා කල හැකි ඕනෑම ද්‍රව්‍යක්( එය පසුතල නිර්මාණ ශිල්පියාගේ දක්ෂතාවය අනුව සිදුකල හැකි දෙයකි )

❖ පසුතල නිර්මාණ බහුලව යොදා ගත් නාට්‍ය

**1.**කැළනි පාලම **2.**විකෘති

**3.**ට්‍රෝජන් කාන්තාවෝ **4.**ජනේලය **5.**සුභ සහ යස

❖ පසුතල නිර්මාණ භාවිතයට නොගන්නා නාට්‍ය කිහිපයක්

**1.**මනමේ **2.**සිංහබාහු **3.**රත්නාවලී **4.** කදා වළලු **5.**එලොව ගිහින් මෙලොව ආවා

❖ පැවරුම්

**1.**වේදිකා සැරසිලි නිර්මාණ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

**2.**වේදිකා සැරසිලි නිර්මාණ කිරීමේදී සැලකිළි මත් විය යුතු කරුණු **5**ක් ලියන්න

**3.**වේදිකා සැරසිලි නිර්මාණ බහුලව දැකිය හැකි නාට්‍ය **10**ක් ලියන්න.

**4.**නාට්‍යක් සඳහා සුදුසු වේදිකා පසුතලයක් සැලසුම් කරන්න.

**5.**නැවත පාසල් ආරම්භයෙන් පසු විෂයභාර ගුරුභවතා සමග එකතුවී වේදිකා පසුතලයක් නිර්මාණය කරන්න.